# සිරස ඩාන්සින් ස්ටාර්ස් සමග ටිගෝ එක්වේ

**ශ්‍රී ලංකාවේ** පළමු වතාවට නර්තන තරු රැසක් පිරිවරා සිනමා අත්දැකීම ඔබ වෙත ගෙන ඒමට ටිගෝ පෞද්ගලික සමාගම පූර්ණ අනුග්‍රහය දක්වයි. සිරස ඩාන්සින් ස්ටාර් නර්තන ප්‍රසංගයට ප්‍රථම වරට සහභාගී වූ නර්තන තරු රැස සමගින් මෙම සිනමාපටය නිෂ්පාදනය කර තිබේ.

මෙහිදී ප්‍රථමවරට මෙම සිනමාපටයේ අඩංගු දේ ඩවුන්ලෝඩ් කර ගැනීමේ අවස්ථාව හිමි වන්නේ ටිගෝ පාරිභෝගිකයන්ටයි. ඒවා අතර

1 ටිගෝ කොල් අ ටියුන් (රින්ගින් ටෝන්ස්) තත් 30

2 Mp3/ ට්‍රූ ටෝන්ස් / මොනො ටෝන්ස්

3 වොල් පේපර්ස්

4 ඇනිමේෂන් / තීම්ස් ආදිය අඩංගුවේ.

මෙම සිනමාපටයේ ගීත අඩංගු තැටියක් ජනවාරි 28 වන දින එළිදැක් වූ අතර මේ සඳහා ප්‍රධාන නිල අනුග්‍රහය දක්වන ටිගෝ සමාගම වෙත ගී තැටි 10,000ක් ද තිළිණ කරන ලදී.

අලුත් ටිගෝ පාරිභෝගිකයන්ටද 2009 ජනවාරි 28 සිට පෙබරවාරි 28 දක්වා කාලය තුළ මෙම CD තැටිවලින් 7500ක් දිනා ගැනීමට අවස්ථාවක් ලැබී තිබේ. පැරණි ටිගෝ පාරිභෝගිකයන්ට CD තැටි 2500 ක් දිනා ගැනීමට සහ ගීත ඩවුන්ලෝඩ් කරගැනීමේ අවස්ථාවක් මෙම කාලය තුළ හිමි වේ.

මෙම සිනමාපටයේ එන ගීත 12ක් තම ජංගම දුරකථනයට ඩවුන්ලෝඩ් කර ගැනීමේ විශේෂ අවස්ථාවද හිමි වන්නේ ටිගෝ පාරිභෝගිකයන්ටම පමණි. ටිගෝහි ප්‍රධාන විධායක





නිලධාරී දුමින්ද රත්නායක මහතා පවසන පරිදි පාරිභෝගිකයා සතුටින් තැබීම ඔවුන්ගේ ඉහළම වගකීමක් සහ යුතුකමක් වේ.

"මෙවැනි අනුග්‍රාහක කාර්යකට අත තැබීමෙන් ටිගෝ සමාගමද ඉතා සතුටට පත්වන අතර මේ නිසා සිය පාරිභෝගිකයන්ට නවීනතම අමතර සේවා ලබා දීමටද හැකිවී තිබෙනවා." යැයි දුමින්ද රත්නායක මහතා පැවසීය. "ටිගෝ සමාගම තරුණ සජීවී ප්‍රබෝධමත් ගතියක් පෙන්නුම් කරන අතර එයින් ටිගෝ පාරිභෝගිකයන්ට ලබා දෙන සේවයේ ඇති ප්‍රබෝධමත් ගතියයි. පාරිභෝගික අවශ්‍යතා පිළිබඳ හොඳින් අධ්‍යයනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ටිගෝ සාර්ථක වී තියනවා." යැයි දුමින්ද රත්නායක මහතා වැඩිදුරටත් පවසයි.